# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2470/38 – 2026 ජනවාරි මස 08 වැනි බ්‍රහස්පතින්දා – 2026.01.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 417 - උඩුවාවල බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උඩුවාවල (කොටසක්) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MAHA/HRS/2023/384 හා 2023.07.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – ගලහිටියාවේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0107**

උතුරට: එස්. ඒ. මනම්පේරි හිමිකම් කියන ගලහිටියාවේවත්ත සහ ඇළ; නැගෙනහිරට: බී. ජී. ඒ. ජයසූරිය සහ තවත් අය හිමිකම් කියන ගලහිටියාවේවත්ත, බී. ජී. කිරා හිමිකම් කියන ගලහිටියාවේවත්ත සහ අයි. ජී. ලීලාවති හිමිකම් කියන ගලහිටියාවේවත්ත; දකුණට: අයි. ජී. ලීලාවති හිමිකම් කියන ගලහිටියාවේවත්ත සහ උස්කැටෙහේන; බටහිරට: එස්. ඒ. මනම්පේරි හිමිකම් කියන ගලහිටියාවේවත්ත.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2022/WS/55.
2025 නොවැම්බර් මස 21 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
1200/6, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 – 0074